# <u>රහස්‍යතා දැන්වීම</u>

**ඔබගේ පෞද්ගලික දත්ත පිළිබඳව අපි සැළකිලිමත් වන්නෙමු.**

අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් සහ අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් යනු එක්ව ගත කළ අලියාන්ස් ලංකා ලෙස හැඳින්වෙන ජීවිත සහ ජීවිත නොවන රක්ෂණ සමාගම් වන අතර ශ්‍රී ලංකාවෙහි ජීවිත නොවන සහ ජීවිත රක්ෂණ ප්‍රගුණ කිරීමේ බලපත්‍රලාභී අලියාන්ස් SE හි පූර්ණ හිමිකම් සහිත අනුබද්ධිත සමාගම් ය. ඔබගේ රහස්‍යතාවය සුරක්ෂිත කිරීම අපගේ ඉහළම ප්‍රමුඛතාවක් වේ. මෙම රහස්‍යතා දැන්වීම එක්රැස් කරනු ලබන පෞද්ගලික දත්ත මොනවද, එක්රැස් කරන්නේ කෙසේද, එක්රැස් කරන්නේ කුමක් පිණිස ද සහ ඒවා අනාවරණය කරන්නේ සහ බෙදාහරින්නේ කිනම් ය අතරද යන වග පැහැදිලි කරයි.

## 1. දත්ත පාලක යනු කවුද?

දත්ත පාලක යනු කඩදාසි ලිපිගොනු හෝ විද්‍යුත් ලිපිගොනු වල දත්ත තබාගැනීම සහ පරිහරණය කිරීම පාලනය කරන හෝ ඒ සඳහා වගකීම දරන පුද්ගලයා හෝ නෛතික පුද්ගලයාය. අදාළ දත්ත ආරක්ෂා කිරීම පිළිබඳ නීති සහ රෙගුලාසි මගින් අර්ථ දැක්වෙන පරිදි අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් සහ අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් යනු දත්ත පාලකයන් වේ.

## 2. එක්රැස් කරනු ලබන්නේ කෙබඳු පෞද්ගලික දත්ත ද?

ඔබ පිළිබඳ පහත පරිදි විවිධ පෞද්ගලික දත්ත අප විසින් එක්රැස් කෙරෙනු සහ සකස් කෙරෙනු ඇත.

- සම්පූර්ණ නම
- ලිපිනය
- උපන්දිනය
- ස්ත්‍රී පුරුෂ භාවය
- ජාතික හැඳුනුම්පත්/ විදේශ ගමන් බලපත්‍ර තොරතුරු
- දුරකථන අංකය
- විද්‍යුත් තැපැල් ලිපිනය
- අධ්‍යාපනික සහ වෘත්තීය අත්දැකීම් සහ අනුබද්ධතා
- ව්‍යාපාර කටයුතු
- සංචාර සහ වියදම් පිළිබඳ තොරතුරු
- මූල්‍යමය තොරතුරු (උදා: ණය/හර කාඩ්පත් සහ බැංකු ගිණුම් පිළිබඳ තොරතුරු වැනි දෑ)
- හඳුනාගැනීමේ පරීක්ෂාවන් සහ පසුබිම් පරීක්ෂාව
- වෙනත් තොරතුරු (උදා:පවුලේ තොරතුරු, ජීවන රටාව, සමාජ තත්ත්වයන් වැනි දෑ)

තවද අප ඔබගේ “සංවේදී පෞද්ගලික දත්ත”, උදාහරණ ලෙස වෛද්‍ය වාර්තා වල ප්‍රතිඵල හෝ මරණ සහතික වලට අදාල දත්ත, ඔබගේ අතීත හිමිකම්, සාපරාධී වරදකරු කිරීම, ඔබගේ ජානමය හෝ ජෛවමිතික දත්ත වැනි දෑ රැස්කර සකසන්නෙමු.

## 3. අප ඔබගේ පෞද්ගලික දත්ත ලබා ගන්නේ සහ භාවිත කරන්නේ කෙසේද?

අප ඔබගේ පෞද්ගලික දත්ත අපගේ නීත්‍යානුකූල අවශ්‍යතා මත සහ/හෝ අපගේ නීතිමය බැඳීම් වලට අනුකූලව රැස්කර පරිහරණය කරන්නෙමු.

- රක්ෂණ කොන්ත්‍රාත් පරිපාලනය
- ණය අය කරගැනීම පරිපාලනය
- කාර්මික පරිපාලනය, පර්යේෂණ සහ අලියාන්ස්හි සංවර්ධනය
- පාරිභෝගික හෝ භාවිතාකරන්නන්ගේ පරිපාලනය සහ අලෙවිකරණය සඳහා
- ව්‍යාපාරික සම්බන්ධතා පවත්වාගෙන යාම සඳහා
- අපගේ ව්‍යාපාර සබඳතා සම්බන්ධව පර්යේෂණ සහ විශ්ලේෂණ පැවැත්වීමට
- ඔබ අපගේ අලියාන්ස් වෙබ් අඩවියෙහි සැරිසරන විට හෝ අපගේ පුවත්පත්‍රයට හෝ තැපැල් ලැයිස්තුව නිර්දේශ කරන විට අපගේ සිදුවීම්, සේවා, නිෂ්පාදන සහ පුවත් පිළිබඳ ඔබට දැන්වීමට
- සුරැකුම්පත් නීතිය, පොදු සමාගම් ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවසහ අදාළනීති සහ රෙගුලාසි වලට අනුකූලවීම සම්බන්ධයෙන් පහසුකම් සැළසීම
- වංචා වැළක්වීම සහ අනාවරණය කර ගැනීම
- නීතිමය බැඳීයාවන්ට අනුකූල වීම (උදා: බදු, ගිණුම් සහ පරිපාලනමය බැඳීයාවන්)

පොදු සහ වාණිජමය පරිගණක දත්ත ගබඩා වලින් ඔබ පිළිබඳව ලබා ගත් පෞද්ගලික දත්ත ඉහතින් දක්වා ඇති අරමුණු උදෙසා අපි සකසන්නෙමු.

පෞද්ගලික දත්ත සකස් කිරීම සඳහා ඔබගේ අනුමැතිය අවශ්‍ය වන්නේ කිනම් අවස්ථාවකදැයි අපි ඔබට දැනුම් දෙන්නෙමු. එසේ නොමැතිනම්, අපගේ නීත්‍යානුකූල ව්‍යාපාර අවශ්‍යතා වලට (ගණුදෙනු කරුවන් සමග සම්බන්ධතා පැවැත්වීම, අලියාන්ස් පිළිබඳ අලුත් තොරතුරු සහ විස්තර සැපයීම, අවස්ථා සංවිධානය සහ සත්කාරකත්වය ලබාදීම සහ වෙළඳපල පර්යේෂණ සහ විශ්ලේෂණ පැවැත්වීම ඇතුලත්ව) හෝ නීතිමය බැඳීමකට අනුකූල වීමට අවශ්‍ය වූ විටක අපි ඔබගේ පෞද්ගලික දත්ත සකසන්නෙමු. මීට අමතරව, ඔබ සමග කොන්ත්‍රාත්තුවක් ඇති කර ගැනීමට හෝ ඔබ සමග පවතින කොන්ත්‍රාත්තුවක් යටතේ අපගේ බැඳීයාවන් ඉටු කිරීමට අප ඔබගේ පෞද්ගලික දත්ත සකසන්නෙමු. පෞද්ගලික දත්ත පරිහරණයෙහි ලා අලියාන්ස් එහි අදාළ නීති සහ රෙගුලාසි වලට ගරු කරයි.

## 4. ඔබගේ පෞද්ගලික දත්තවලට ප්‍රවේශ වීමේ හැකියාව කා සතු ද?

ඉහතින් දක්වා ඇති අරමුණු වලට අනුකූල වන පරිදි ඔබගේ පෞද්ගලික දත්ත සකස් වන බවට අපි සහතික වන්නෙමු.

දක්වා ඇති අරමුණු උදෙසා තෙවන පාර්ශ්වයේ දත්ත හසුරුවන්නන් ලෙස ක්‍රියාත්මක වන පහත පාර්ශ්වයන් සඳහා ඔබගේ පෞද්ගලික දත්ත අනාවරණය කෙරෙනු ඇත.

- මහජන බලධාරීන්, අලියාන්ස් සමූහයේ වෙනත් සමාගම්, වෙනත් රක්ෂණකරුවන්, සම රක්ෂණකරුවන්, ප්‍රතිරක්ෂණකරුවන්, රක්ෂණ අතරමැදියන්/තැරව්කරුවන් සහ බැංකු

අපගේ උපදෙස් අනුව දත්ත සකසන්නන් ලෙස ක්‍රියාත්මක වන පහත පාර්ශ්වයන් සමග දක්වා ඇති අරමුණු උදෙසා අප ඔබගේ දත්ත හුවමාරු කරගනු ඇත.

- මෙහෙයුම් (වන්දි, තොරතුරු තාක්ෂණ, තැපැල්, ලිපිගොනු කළමනාකරණය) ඉටුකිරීම සඳහා අලියාන්ස් සමාගමේ වෙනත් සමාගම්, තාක්ෂණික උපදේශකයන්, ප්‍රවීණයන්, නීතිඥයන්, පාඩු ගැලප්පුම්කරුවන්, අලුත්වැඩියාකරන්නන්, වෛද්‍යවරු සහ සේවා සමාගම්;
  සහ
- දේශීය නීතිය යටතේ අවසර දී ඇති පරිදි සහ ඔබගේ සන්නිවේදන රුචිකත්වයන්ට අනුව අලෙවිකරණ සන්නිවේදනයන් ඔබ වෙත යැවීම සඳහා ප්‍රචාරකයන් සහ වෙළඳ දැන්වීම් ජාලයන්.
  ඔබගේ අවසරයෙන් තොරව ඒකාබද්ධ නොවන තුන්වන පාර්ශ්වයන්ට ඔවුන්ගේ වෙළඳ පරිහරණය සඳහා අපි ඔබගේ පෞද්ගලික දත්ත ලබා නොදෙන්නෙමු.

අවසාන වශයෙන්, අප පහත අවස්ථාවන්හිදී ඔබගේ පෞද්ගලික දත්ත හුවමාරු කරගන්නෙමු;

- අපගේ සමස්ත ව්‍යාපාරය, වත්කම හෝ සම්භාරයෙහි හෝ එහි කොටසක ප්‍රකල්පිත හෝ සැබෑ සංවිධානයක්, ඒකාබද්ධ, විකිණුම්, හවුල් ව්‍යාපාරයක්, පවරදීමක්, විකිණීමක් හෝ වෙනත් ස්වභාවයක් වන අවස්ථාවකදී සහ
- අප ඔබට සපයනු ලැබූ යම් නිෂ්පාදනයක් හෝ සේවාවක් පිළිබඳ ඔබ පැමිණිල්ලක් කලොත්, අදාල ඔම්බුඩ්ස්මන්වරයා ඇතුළුව ඕනෑම නීතිමය බැඳීමක් සපුරාලීමට.

## 5. මාගේ පෞද්ගලික දත්ත සැකසෙන්නේ කොතැනද?

ඉහතින් සඳහන්ව ඇති ආකාරයට ඔබගේ පෞද්ගලික දත්ත පාර්ශ්වකරුවන් විසින් දැනගැනීමේ අවශ්‍යතාවය මත පදනම්ව ලොව පුරා සකස්වනවා විය හැක. අදාළ දත්ත ආරක්ෂා කර ගැනීමේ නීති සහ රෙගුලාසි වලට අනුකූලව රහස්‍යතාව සහ ආරක්ෂාව සම්බන්ධයෙන් ගිවිසුම්ගත සීමාවන් ක්‍රියාත්මක වන බව අපි සහතික වන්නෙමු. අප ඔබගේ පෞද්ගලික දත්ත ඒවා සකස් කිරීමට අවසර නොලත් පාර්ශ්වයන්ට අනාවරණය නොකරන්නෙමු.

අප ඔබගේ පෞද්ගලික දත්ත සකස් කිරීම සඳහා යුරෝපීය ආර්ථික ප්‍රදේශයන් වෙත යවන සෑම අවස්ථාවකම, අපි එසේ කරන්නේ පෞද්ගලික දත්ත සඳහා ප්‍රමාණවත් ආරක්ෂාවක් සපයන සහ අලියාන්ස් සමූහයේ සියලුම සමාගම් සමග නිත්‍යානුකූලව බැඳී සිටින අලියාන්ස් රහස්‍යතා ප්‍රමිතිය (අලියාන්ස් BCR - ආයතනික නීති රීති) ලෙස හැඳින්වෙන අලියාන්ස් අනුමත කරන ලද ආයතනික නීති රීති මතය. අලියාන්ස් BCR සහ ඒවාට අනුකූල වන අලියාන්ස් සමූහයේ සමාගම් ලයිස්තුවට ප්‍රවේශ වීමේ හැකියාව ඇත. අලියාන්ස් ආයතනික නීති රීති අදාළ නොවන අවස්ථාවන්හිදී, ඒ වෙනුවට අපි ඔබගේ පෞද්ගලික දත්ත යුරෝපීය ආර්ථික ප්‍රදේශයන් වෙත යවන විට ශ්‍රී ලංකාවේදී මෙන් ප්‍රමාණවත් ආරක්ෂක මට්ටමක් ලැබෙන බව තහවුරු කිරීමට පියවර ගන්නෙමු.

## 6. ඔබගේ පෞද්ගලික දත්ත සම්බන්ධව ඔබගේ අයිතීන් මොනවාද?

අදාළ නීතිය හෝ රේගුලසියෙන් අවසර ලබා දී ඇති විටක, පහත සඳහන් දේ කිරීමට අයිතියක් ඇත;

- ඔබ පිළිබඳව ඇති ඔබගේ පෞද්ගලික දත්තවලට ප්‍රවේශ වීමට සහ දත්තවල ආරම්භය, සකස් කිරීමේ අරමුණ සහ අවසානය, දත්ත පාලක/පාලකයන්, දත්ත සකස් කරන්නා/කරන්නන් සහ දත්ත නිරාවරණය කරනු ලබන පාර්ශ්වයන් පිළිබඳව දැන ගැනීමට

- ඔබේ කැමැත්ත පරිදි පෞද්ගලික දත්ත සකස් කිරීමේදී ඕනෑම අවස්ථාවක දී ඔබගේ කැමැත්ත ඉවත් කර ගැනීමට
- ඔබගේ පෞද්ගලික දත්ත සැමවිටම නිවැරදිව පවත්නා පරිදි ඒවා යාවත්කාලීන නැතිනම් නිවැරදි කිරීමට
- ඉහතින් දක්වා ඇති අරමුණු සඳහා ඔබගේ පෞද්ගලික දත්ත තවදුරටත් අවශ්‍ය නොවන්නේ නම්, අපගේ ලේඛන වලින් මකා දැමීමට
- උදාහරණ ලෙස ඔබ ඔබගේ පෞද්ගලික දත්තවල නිවැරදිභාවය විවාදයට නගා ඇති අවස්ථාවන්හිදී අපට ඒවායේ නිවැරදි බව සනාථ කර ගැනීමට කාලය ලැබෙන පරිදි - ඇතැම් අවස්ථාවලදී- ඔබගේ පෞද්ගලික දත්ත සැකසීම සීමා කිරීමට
- ඔබට හෝ ඔබගේ නව රක්ෂණකරු සඳහා විද්‍යුත් ආකෘතියට අනුව ඔබගේ පෞද්ගලික දත්ත ලබාගැනීමට සහ
- අප සහ/හෝ අදාළ දත්ත ආරක්ෂක අධිකාරිය වෙත පැමිණිල්ලක් ගොනු කිරීමට

ඔබට අයිතිය ඇත.

## 7. ඔබගේ පෞද්ගලික දත්ත සකස් කිරීමේ ක්‍රියාවලියට විරෝධය දැක්විය හැක්කේ කෙසේද?

අදාළ නීතිය හෝ රෙගුලාසිය මගින් අවසර දී ඇති පරිදි, අප ඔබගේ පෞද්ගලික දත්ත සකස් කිරීම සම්බන්ධව එරෙහිවීම් හෝ ඒවා සකස් කිරීම නවතා දමන ලෙස අපට පැවසීමේ අයිතිය ඔබ සතුය. (ඍජු අලෙවිකරණය සඳහා වන අරමුණු ද ඇතුළත්ව) මෙම ඉල්ලීම සම්බන්ධව ඔබ අපට දැනුම් දුන් වහාම, අදාළ නීතිය හෝ රෙගුලාසිය මගින් අවසර ලබා දී ඇති පරිදි හැරුනුකොට අප තවදුරටත් ඔබගේ පෞද්ගලික දත්ත සකස් නොකරනු ඇත.

ඉහතින් දක්වා ඇති අනෙකුත් අයිතීන් හා සමාන ලෙස ඔබට මෙම අයිතිය ක්‍රියාත්මක කල හැක.

## 8. අපි ඔබගේ පෞද්ගලික දත්ත කොපමණ කාලයක් රඳවා තබාගන්නෙමු ද?

අප ඔබගේ පෞද්ගලික දත්ත ඒවා රැස් කළ අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍යවනතාක් හෝ නීතිමය බැඳීම් ඉටුකිරීමට පමණක් රඳවා තබා ගැනීමට අපි කැපවී සිටිමු.

අවශ්‍යතාවයට වඩා වැඩි කාලයක් අප එම දත්ත රඳවා තබා නොගන්නා අතර ඒවා ලබා ගත අරමුණු සඳහාම පමණක් අපි එය ළඟ තබා ගන්නෙමු.

## 9. අප සමඟ සම්බන්ධ විය හැක්කේ කෙසේද?

අප ඔබගේ පෞද්ගලික දත්ත පරිහරණය කරන ආකාරය පිළිබඳව ඔබට යම් ගැටළු පවතී නම්, ඔබට පහත පරිදි දුරකථනයෙන්, විද්‍යුත් තැපැල මගින් හෝ තැපැල මගින් අප සමග සම්බන්ධ විය හැකිය;

අලියාන්ස් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ් / අලියාන්ස් ලයිෆ් ඉන්ෂුවරන්ස් ලංකා ලිමිටඩ්,
දත්ත ආරක්ෂක නිලධාරී,
නීති සහ අනුකූලතා දෙපාර්තමේන්තුව,
අංක 675, වෛද්‍ය ඩැනිස්ටර් ද සිල්වා මාවත,
කොළඹ 09, ශ්‍රී ලංකාව
0112 132 008
privacy@allianz.lk

**10. අප මෙම රහස්‍යතා දැන්වීම යාවත්කාලීන කරන්නේ කොපමණ කලකට වතාවක් ද?**

අපි මෙම රහස්‍යතා දැන්වීම නිතිපතා සමාලෝචනය කරන්නෙමු. ඔබට බලපෑ හැකි වැදගත් වෙනසක් ඇති විට අපි ඔබට සෘජුවම පවසන්නෙමු.